WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. (i) ජේසුස් වහන්සේ කොටළුවකු පිට රාජ තේජසින් ජෙරුසලමට වැඩම කරන බව දිවැස් වැකි පල කළ දිවැසිවරයා නම් කරන්න. මෙම ක්‍රියාව මගින් ජේසුස් වහන්සේගේ නායකත්වය පිළිබඳ ඉස්මතු කෙරෙන විශේෂ ගුණාංගය කුමක් ද?

 (ii) ධර්මදූත සේවය සඳහා ජේසුස් වහන්සේ පිටත්කර යැවූ ඔහුගේ ගෝලයන් හට දුන් **එක්** උපදේශයක් සහ පවරන ලද **එක්** බලතලයක් ලියන්න.

 (iii) ජේසුස් වහන්සේගේ ධර්ම දූත මෙහෙවරයේ ප්‍රධාන තේමාව වූයේ කුමක් ද? එය ඉදිරිපත් කිරීම සඳහා සිය සේවයේ දී උපයෝගි කරගත් **එක්** ක්‍රමවේදයකට උදාහරණයක් සඳහන් කරන්න.

 (iv) ඵල නොදැරූ අත්තික්කා ගස යන රූපකයෙන් ජේසුස් වහන්සේ පැවසුවේ කවුරුන් ගැන ද? දේව රාජ්‍යයේ පුරවැසියන් වන අපට එයින් ලබාදෙන පණිවුඩය කුමක් ද?

 (v) පහත දැක්වෙන ජුදෙව් චාරිත්‍ර දෙකෙහි ඓතිහාසික වැදගත්කම කුමක් ද?
  (අ) චර්ම ඡේදනය
  (ආ) කුලුඳුල් පිරිමි දරුවන් කැප කිරීම

 (vi) (අ) ජෙරුසලමේ මන්ත්‍රණ සභාවේ නායකත්වය දැරුවේ කවුරුන් ද?
  (ආ) ජෙරුසලමේ මන්ත්‍රණ සභාව මගින් අන්‍ය ජාතීන් ලැබූ වරම කුමක් ද?

 (vii) ආමොස් දිවැසිවරයා ප්‍රකාශ කළ එදා සමාජයේ පැවැති අයුක්තිය හා අසාධාරණය අද අප සමාජයේ දක්නට ලැබෙන්නේ කුමන අන්දමට ද?

 (viii) 1 කොරින්ති 13 වන පරිච්ඡේදයේ සඳහන් වන 'ප්‍රේම පාරමිතාවේ' 'ප්‍රේමය' තුළින් ඉස්මතු වන අප ජීවිතවලට අනුගත කළ යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

 (ix) පාවුල් තුමා සමග පළමු ධර්මදූත චාරිකාවේ සම්බන්ධ වූ **එක්** අයෙක් නම් කර, මෙම චාරිකාවේ දී පාවුල් සිදු කළ ප්‍රධාන හාස්කමක් සඳහන් කරන්න.

 (x) දේව රාජ්‍යයේ **එක්** ප්‍රධාන ප්‍රතිපත්තියක් සඳහන් කර, එය සනාථ කිරීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමාව කුමක් දැයි ලියන්න.

WWW.OLEVELAPI.COM

2. 'මනුෂ්‍ය පුත්‍රයාණෝ සබත් දිනට පවා අධිපතියාණෝ ය'

 (i) ජේසුස් වහන්සේ ඉහත ප්‍රකාශය කිරීමට තුඩුදුන් පසුබිම කුමක් ද?

 (ii) ජේසුස් වහන්සේ නීතිය හා චාරිත්‍රවලට වඩා මනුෂ්‍යත්වය උතුම් බව දැක්වීමට උපයෝගී කරගත් අවස්ථා **තුනක්** සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න.

 (iii) ජේසුස් වහන්සේ ක්‍රියාකළ ආකාරය ආදර්ශයට ගනිමින් කිතුනු අප සමාජ සාධාරණත්වය හා යහපත උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** පහදන්න.

3. (i) දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් ජේසුස් වහන්සේ අපේක්ෂා කරන විශේෂ චරිත ලක්‍ෂණ **දෙකක්** ලියන්න.

 (ii) ඉහත (i) හි සඳහන් කරන ලද **එක්** චරිත ලක්‍ෂණයක් ගෙනහැර පෑමට ජේසුස් වහන්සේ උපයෝගි කර ගත් **එක්** උපමාවක් ලුහුඬින් ඉදිරිපත් කරන්න.

 (iii) ජේසුස් වහන්සේගේ උපමා තුළින් ඉදිරිපත් කරන ලද දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ තිබිය යුතු චරිත ලක්ෂණ **පහක්** පැහැදිලි කරන්න.

[ඉත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** දරුවන් දේව දායාදයක් ලෙස බයිබලය අපට අනාවරණය කරයි.

(i) ජේසුස් වහන්සේ මෙලොව සේවය කළ කාලය තුළ දී ජුදා සමාජයේ දරුවන්ට හිමි වූයේ කෙබඳු තත්ත්වයක් ද?

(ii) ජේසුස් වහන්සේ දරුවන්ගේ වටිනාකම සිය අනුගාමිකයන්ට විදහා පෑ අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) වත්මන් සමාජය තුළ ඇති ළමා අපචාර **පහක්** ලැයිස්තු ගත කර, එබඳු තත්ත්ව වලක්වාලීමට හා ගොදුරු වූවන්ට අතහිත දීමට කිතුනු අප ගත යුතු ක්‍රියාමාර්ග **පහක්** යෝජනා කරන්න.

**5.** 'පාවුල් තුමා විශේෂ ධර්මදූත සේවාවක් ඉටු කළ නායකයෙක් ලෙස සලකනු ලබයි.'

(i) ධර්මදූත සේවය සඳහා පාවුල් තෝරා පත් කළේ කුමන ස්ථානයේ පිහිටි සභාව මගින් ද? ඒ සඳහා සභාවට මගපෙන්වීම ලැබුවේ කෙසේ ද?

(ii) පාවුල් ප්‍රදර්ශනය කරන ලද විශේෂ නායකත්ව ගුණාංග **තුනක්** නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.

(iii) ඔබට පාසලේ නායකත්වයක් ලැබුණහොත් ඉහත (ii) හි සඳහන් කරන ලද නායකත්ව ගුණාංග අනුගමනය කිරීමට අපේක්ෂා කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

**6.** (i) මුල් කිතුනු සභාවේ දක්නට ලැබුණු උතුම් වටිනාකම් **දෙකක්** ලියන්න.

(ii) මුල් කිතුනු සභාව අභියෝගවලට මුහුණ දෙමින් සමාජ සාධාරණත්වය හා සමාජ සත්කාරය සඳහා ක්‍රියා කළ අවස්ථා **තුනක්** ලියා දක්වන්න.

(iii) මුල් කිතුනු සභාවේ වටිනාකම්, වත්මන් කිතුනු සභා විසින් ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන, බයිබලීය ඉගැන්වීම් පදනම් කරගෙන ලුහුඬු සටහන් ලියන්න.

(i) කිතුනු එක්සත්කම

(ii) අභියෝග මැද සේවය

(iii) දුක් විඳීම පිළිබඳ කිතුනු ආකල්පය

(iv) සේවක නායකත්වය

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...